දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/7/1/13/1/20 110
ඔබේ අංකය / உமது இல. / Your No.: TA/SA/13/2014
දිනය / திகதி / Date: 2018.01. 02

08 JAN 2018

ලේකම්,

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීම.</u>

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2017.11.24 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -
01. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි.)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි.)

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : අදාල නොවේ

1.2. අමාත්‍යාංශය: සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
යොමු අංකය: TA/1A/13/2014 දිනය : ....................

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:
යොමු අංකය:DMS/0054/PPSM දිනය : 2013.12.23
යොමු අංකය: DMS/0054 දිනය : 2013.12.31
යොමු අංකය: DMS/0054/PPSM දිනය : 2014.04.01

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය:Est-3/RECRU/04/6642 දිනය : 2012.08.29

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:
යොමු අංකය : NSCC/4/13/SR/19 දිනය : 2017.08.31

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:
යොමු අංකය: PSC/EST/07-01-13/01/2012 දිනය : 2014.10.07
යොමු අංකය: PSC/EST/7/1/13/1/2012 දිනය : 2016.09.22

02. පත් කිරීම් බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවා - ඛණ්ඩ 01

3.2. ශ්‍රේණි : III, II, I, අධි ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

වෛද්‍ය විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ සම සෞඛ්‍ය විද්‍යා උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව හදාරා වෘත්තිකයෙකු ලෙස වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා රෝග විනිශ්චය, රෝග නිවාරණය සහ රෝග ප්‍රතිකාර සේවා ඉටුකිරීම සඳහා පත්කිරීමේ බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලැබ ඇති කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටුකරනු ලැබිය යුතු ය.

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු ය.

05. වැටුප්

5.1. සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය : MT 6 – 2016

5.2. වැටුප් පරිමාණය : රු. 32,080- 10 × 445 - 11 × 660 - 10 × 730 - 10 × 750 - 58,590

5.3. සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු. 32,080/= |
| II | පියවර 12 | රු. 37,190/= |
| I | පියවර 23 | රු. 44,520/= |
| අධි | පියවර 32 | රු. 51,090/= |

සටහන - පුහුණු කාලය තුළදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව දීමනාවක් ගෙවනු ඇත. (රජය විසින් කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව මෙම දීමනා වෙනස් විය හැක.)

06. සේවා ගණයට අයත් තනතුරු -

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව, ඒවාට පැවරෙන කාර්යයන් ඇමුණුම - 01 මඟින් දක්වා ඇත.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

- වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ - 1199
- ඖෂධවේදී - 1033
- විකිරණ ශිල්පී - 592
- භෞත චිකිත්සක - 404
- වෘත්තීය චිකිත්සක - 126

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා අධි ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය
7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්/ වෘත්තීය සුදුසුකම් :

| අනු අංකය | තනතුර | අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| 01 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | (අ). සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම<br><br>හෝ<br><br>(ආ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ වෛද්‍ය රසායනාගාරවේදී උපාධියක් ලබා තිබීම<br><br>හෝ<br><br>විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් පවත්වන මාස 06ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම |

| | | |
|---|---|---|
| 02. | ඖෂධවේදී | (අ). සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම<br><br>සහ<br><br>වෛද්‍ය විද්‍යාල සභාව මගින් මෙහෙයවනු ලබන පූර්ණ කාලීන (අභ්‍යන්තර) ඖෂධවේදී ද්‍වි අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම<br><br>හෝ<br><br>(ආ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී / විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම<br><br>හෝ<br><br>විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පවත්වන මාස 06ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම |
| 03 | විකිරණ ශිල්පී | (අ). සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම<br><br>සහ |

| | | |
|---|---|---|
| | | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම<br>හෝ<br><br>(ආ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ විකිරණ ප්‍රතිකාරකවේදී/විකිරණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම<br><br>හෝ<br><br>විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් විකිරණ ශිල්පියකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පවත්වන මාස 06ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම |
| 04. | භෞත චිකිත්සක | (අ). සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු භෞත චිකිත්සක ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම |

| | | |
|---|---|---|
| | | හෝ<br><br>(ආ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ භෞත චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම<br>හෝ<br><br>විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් භෞත චිකිත්සකයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පවත්වන මාස 06ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම |
| 05. | වෘත්තීය චිකිත්සක | (අ). සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වෘත්තීය චිකිත්සක දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම<br><br>හෝ<br><br>(ආ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෘත්තීය චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම<br><br>හෝ |

| | | |
|---|---|---|
| | | විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෘත්තීය චිකිත්සකයකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.<br><br>සහ<br><br>සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පවත්වන මාස 06ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම |

7.2.2.2 පළපුරුද්ද : අදාල නොවේ

7.2.2.3 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.4 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය, තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු දිනට පූර්වාසන්න අවුරුදු තුනක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතුය.

III. පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලබන දිනට විශ්ව විද්‍යාලයක හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

IV. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

V. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18

7.2.3.2. උපරිම වයස් සීමාව : අවුරුදු 35

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

බඳවා ගැනීමේ ක්‍රමය

<u>(අ) උපාධිධාරීන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීම</u>

අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා ගනු ලබන සංඛ්‍යාව පවතින හා ඉදිරි වර්ෂය තුල ඇතිවිය හැකි පුරප්පාඩු සංඛ්‍යාව අනුව සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

සටහන

1. රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා සිසු නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

2. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා උපාධිධාරීන් සිටිනම් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට තෝරා ගැනීම සඳහා සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය පිළිබඳ පැය 01 ක ලිඛිත විභාගයක් පවත්වනු ලැබේ.

3. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල හෝ අයදුම්කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව අනුව පුහුණුවට බඳවා ගනු ලබන ප්‍රමාණයට සමාන හෝ නොවැඩි අයදුම්කරුවන් ප්‍රමාණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයකට කැඳවනු ලබන අතර ඔවුන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් එම සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ. ( සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ)

(ආ) අ.පො.ස (උ.පෙළ) සමතුන් පුහුණුවට බඳවා ගැනීම

අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් අනුව පුහුණුවට බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ උපාධිධාරීන් මාස හය (06)ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා බඳවා ගැනීමෙන් පසු ඉතිරිවන පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගෙනය.

පුහුණුව සඳහා බඳවා ගනු ලබන සංඛ්‍යාව, සලකා බලනු ලබන වර්ෂයේ ජෛව විද්‍යා හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවට හා එක් එක් පළාත අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමානුපාතිකව එක් එක් විෂය ධාරාවෙන් ඉහළම Z අගය ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

වර්ෂ දෙකක හෝ ඊට වැඩි වර්ෂ ගණනක ප්‍රතිඵල මත පුහුණුව සඳහා බඳවා ගනු ලබන්නේ නම්, සලකා බලනු ලබන වර්ෂවල ජෛව විද්‍යා හෝ භෞතික විද්‍යා විෂය ධාරාවන්ගෙන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවට හා එක් එක් පළාත අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් විෂය ධාරාවෙන් ඉහළම Z අගය ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

සටහන

1. අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත පුහුණුව සඳහා අයදුම්පත් කැඳවන වර්ෂයන් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

2. රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් පුහුණුව සඳහා සිසු නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

3. පුහුණුවට බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාවට අනුව ඉහළම Z අගය ලබාගෙන ඇති අයදුම්කරුවන්ගෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් ප්‍රමාණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයකට කැඳවනු ලබන අතර ඔවුන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් එම සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ. ( සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ)

පුහුණුවට බඳවා ගැනීමට අදාල කොන්දේසි

(i) පුහුණුවට බඳවා ගනු ලබන දිනට විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

(ii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය. අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත අයදුම්කරන පුද්ගලයින් තමන් අයදුම් කරන පළාත තුල සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු දිනට පූර්වාසන්න අවුරුදු තුනක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතුය.

(iii) පුහුණුව සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතු ය.

(ඇ) III වන ශ්‍රේණියට බඳවා ගැනීම

- අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන සිසු නිලධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල හා එක් එක් තනතුරේ පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

- ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවන් සාර්ථකව සම්පූර්ණ කරනු ලබන සිසු නිලධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල, පුහුණුවට බඳවා ගැනීමේදී සලකා බලනු ලැබූ පළාත හා එක් එක් තනතුරේ පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ.)

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ලේකම්

7.2.4.3.2 ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම

සටහන : සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව: අවස්ථානෝචිත පරිදි අදාල පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත් කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබයි.

7.2.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම පලකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින්

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 3 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 3 ක් ගතවීමට පෙර | ලිඛිත / වාචික සහ ප්‍රායෝගික පරීක්ෂණයකි |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර 5 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |

(එක් එක් කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල විෂය නිර්දේශයන් ඇමුණුම 02 - I, ඇමුණුම 02 - II, ඇමුණුම 02 - III හි සඳහන් වේ.)

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ? වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම - සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ලේකම්

2 වන කාර්යක්ෂමතා කඩඉම - සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ලේකම්

3 වන කාර්යක්ෂමතා කඩඉම - සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ලේකම්

(අ) කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| එක් එක් බඳවා ගැනීම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් | |
|---|---|
| පැරණි බඳවාගැනීම් පරිපාටිය | නව බඳවාගැනීම් පරිපාටිය |
| (1), I කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>• විෂය ක්ෂේත්‍රයට අදාල (ලිඛිත, වාචික, ප්‍රායෝගික)<br>• ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | (1). I කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි |
| (2). II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්න පත්‍රය →<br>• කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | (2). II කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ලිඛිත, වාචික, ප්‍රායෝගික)<br>{ • ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි |
| | (3). III කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) |

(අ). පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විෂය සමත් නිලධාරීන් මෙම බඳවාගැනීම් පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීම කරනු ලැබේ.

(ආ) මෙම බඳවා ගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු නිලධාරීන්, පැවති බඳවා ගැනීම් පරිපාටියට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් එක් විෂයයන්ට අනුරූපී වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් සමත් වීමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල යුතුය. අනුරූපී විෂයයන් ඉහත සඳහන් වගුවෙහි දැක්වේ. පැරණි බඳවා ගැනීම් පටිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අනුරූපී විෂයන් සමත්වී ඇත්නම් එම විෂයන් පමණක් නව බඳවා ගැනීම් පරිපාටිය යටතේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ) නව බඳවාගැනීම් පරිපාටිය බලාත්මක වන දිනට I ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා තුන් වන කාර්යක්ෂමතා කඩයිම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඈ) මෙහි උපජේද අංක (ඇ) හි සඳහන් පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනස් වුව ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාල කාලසීමාව වෙනස් නොවේ.

(ඊ) නිදහස් කිරීම
ආචාර්ය තනතුරෙහි සේවය කරන නිලධාරින් පිළිගත් ආයතනයකින් ඉගැන්වීම පිළිබඳ මාස 06ක පුහුණුවක් ලබා තිබේ නම් III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුලදී ලබාගත යුතුය. |
| 02 අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා තිබිය යුතුයි. |

10. ශ්‍රේණි උසස් කිරීම් :

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයාගෙන තිබීම

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම

vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයාගෙන තිබීම

ii. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.3 I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයා ගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරිකෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් අධි ශ්‍රේණිට උසස් කිරීම සඳහා පත් කිරීමේ බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| 01. ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ<br><br>02. ආචාර්ය ඖෂධවේදී<br><br>03. ආචාර්ය විකිරණ ශිල්පී පාසැල<br><br>04. ආචාර්ය භෞත චිකිත්සක<br><br>05. ආචාර්ය වෘත්තීය චිකිත්සක | (i). අදාල තනතුරෙහි ස්ථිර කරන ලද නිලධරයෙකු වීම<br><br>(ii). අදාල තනතුරේ II ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම සමත් II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහල නිලධරයෙකු විය යුතුය.<br><br>(iii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | ආචාර්ය තනතුරු සඳහා තෝරා ගනු ලබන ආකාරය<br>අභ්‍යන්තර චක්‍රලේඛ /රජයේ ගැසට් පත්‍රයේ / ප්‍රසිද්ධ දැන්වීම් පලකිරීම මඟින් අයදුම්පත් කැඳවා සුදුසුකම් ලත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලැබේ.<br><br>**යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ ක්‍රමය**<br><br>ලකුණු ලබාදෙන නිර්ණායකයන් — උපරිම ලකුණු ප්‍රමාණය<br>අමතර සේවා පලපුරුද්ද — 40<br>ඉගැන්වීමේ පලපුරුද්ද — 10<br>අමතර අධ්‍යාපන සුදුසුකම් — 20<br>විශේෂ කුසලතාවයන් — 10<br>ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය — 15<br>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය — 05<br>මුළු ලකුණු — 100<br><br>**ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමය**<br><br>ලකුණු ලබාදෙන නිර්ණායකයන් — උපරිම ලකුණු ප්‍රමාණය<br>අරමුණ හා ප්‍රවිෂ්ඨවීම — 5<br>පෞරුෂය හා හඬ පාලනය — 5<br>සන්නිවේදනයේ පැහැදිලි බව — 5<br>කාල කළමනාකරණය — 5<br>ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය — 5<br>මුළු ලකුණු — 25<br><br>සටහන<br>1. ඉහත වගුවල දැක්වෙන ලකුණු ලබාදෙන නිර්ණායකයන් සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත, එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සවිස්තරාත්මක ලකුණු පරිපාටිය, අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමත කරනු ලබන අවස්ථාවේදී සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | | 2. පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.<br><br>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් ආචාර්ය තනතුර සඳහා පත් කරනු ලැබේ. |

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුලත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහනය (බඳවා ගැනීමේ පරිපාටිය) ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුවූවන් සඳහා) නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT – 06 – 2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක, වෘත්තීය චිකිත්සක නිලධාරීන් ප්‍රතිසංවිධිත වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයට අන්තර්ග්‍රහනය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 පරිච්ඡේදයේ විධි විධාන වලට යටත්ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද නොකල යුතුය.

සේවයේ II " ආ " ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ III වැනි ශ්‍රේණියට

සේවයේ II " අ " ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ II වැනි ශ්‍රේණියට

සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ I වැනි ශ්‍රේණියට

සේවයේ I ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ I ශ්‍රේණියට අදාල වැටුප් වර්ධක දහය (10)ක් උපයා ගෙන ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට

අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති කරුණක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

17. අන්තර්කාලීන විධිවිධාන

සටහන - මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් විධිවිධාන 2016.01.01 දින සිට බලාත්මක වේ.

17.1 ශ්‍රේණි උසස් කිරීම් සම්බන්ධ විධිවිධාන

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ හා අතුරු වෛද්‍ය සේවයේ I වන ශ්‍රේණියේ උසස්වීම් ලබාදීම යන මැයෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2012.03.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014.09.04 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹ ඇති තීරණය අනුව 2010.11.01 දින සිට 2015.12.31 දින දක්වා අන්තර් කාලය ක්‍රියාත්මක වේ. අන්තර්කාලය තුළදී II ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ උසස්වීම් පහත පරිදි ලබාදෙනු ඇත.

17.1.1 II "අ" කාණ්ඩයට / II ශ්‍රේණියට උසස් කිරීම

පුහුණු කාලය ද ඇතුළුව II "ආ" කාණ්ඩයේ / III ශ්‍රේණියේ වසර 08ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් II "අ" කාණ්ඩයට / II ශ්‍රේණියට උසස් කරනු ඇත.

17.1.2 I ශ්‍රේණියට උසස් කිරීම

1) II "අ" කණ්ඩයේ / II ශ්‍රේණියේ වසර 09ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර 15ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් I ශ්‍රේණියට උසස් කරනු ඇත.

සකස් කලේ : අත්සන : ..............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එන්. කේ. එන්. හර්ෂනී
අධ්‍යක්ෂ (පාලන) 02,
නම : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
තනතුර : "සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
දිනය : කොළඹ 10. 17.5

පරීක්ෂා කලේ : අත්සන : ..............................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එච්. ශ්‍රියානි ප්‍රනාන්දු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
ලේකම් වෙනුවට
නම : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
තනතුර : "සුවසිරිපාය"
කොළඹ 10.
දිනය : 17/11/2017

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

වෛද්‍ය ජේ. එම්. ඩබ්. ජයසුන්දර බණ්ඩාර
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
නම : සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
තනතුර : "සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය: 2017/11/18

නිල මුද්‍රාව:

---

යොමු අංකය: TA/1A/13/2014

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හි වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක හා වෘත්තීය චිකිත්සක තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ....................................

නම : ....................................

ලේකම්,

.................................... අමාත්‍යාංශය

දිනය: 24 - 11 - 2017

නිල මුද්‍රාව:

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි
කොළඹ 10.

---

යොමු අංකය: PSC/EST/7/1/13/1/2012

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙ හි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් තනතුරු

.................... සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2016 . 09 . 22 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ....................................

නම : ....................................

ලේකම්.
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2017 . 12 . 22

නිල මුද්‍රාව

ඒ. කුලතුංග
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ - 05.

ඇමුණුම - 01

සේවා ගණයට අයත් තනතුරු

අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 1186 | III සහ I ශ්‍රේණිය<br>- - - - -<br>I ශ්‍රේණිය | (අ). රෝග ප්‍රතිකාරය සහ රෝග සුවවීමේ ප්‍රගමනය තීරණය කිරීම සඳහා අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ වෙනුවෙන් නිදර්ශක එකතු කිරීම හා උපදෙස් ලබාදීම, නිදර්ශක විශ්ලේෂණය, අවශ්‍ය රසායන ද්‍රව්‍ය නිපදවීම, තාක්ෂණික ක්‍රමවේදයන්හි තත්ත්ව පාලනය, පරීක්ෂණ දත්ත නිවැරදිව හා අවශ්‍යතාවට සාපේක්ෂව සැපයීම හා රසායනාගාර වාර්තා නිකුත් කිරීම,<br><br>අවශ්‍ය අවස්ථාවලදී රසායනික ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කිරීම, ගබඩා කිරීම හා ලේඛනගත කිරීම,<br><br>අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යාපන හා ප්‍රායෝගික පුහුණු කටයුතු හා නව පර්යේෂණ ක්‍රම හඳුනා ගැනීමට සහාය වීම,<br>වසංගත රෝග පාලනය, ජාතික රසායනාගාර තත්ව පාලනය, මහජන සෞඛ්‍ය සේවා, විශේෂිත ව්‍යාපාර / වැඩසටහන්, ලේ බැංකු රසායනාගාර හා වෛද්‍ය සේවා ව්‍යාපෘති වලට අවශ්‍ය ව්‍යාධිවේදාත්මක දත්ත සැපයීම,<br>ඉහත කරුණු වලට අමතරව මෙම ශ්‍රේණිවල නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 02 - 17/2006 මගින් පැවරෙන කාර්යයන් වලටද යටත් වේ.<br>- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -<br>(ආ). ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව ඉහත නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, පුහුණු සිසුන් අධීක්ෂණය, විභාග සඳහා දායකත්වය ලබාදීම හා අවශ්‍ය විටදී අංශ පරිපාලනය පිළිබඳව වගකීම දැරීම, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාමික විද්‍යාඥ | 13 | I ශ්‍රේණිය | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම,<br>අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය,<br>පුහුණු පාසල් තුළ විනය පවත්වාගෙන යාම,<br>පුහුණු පාසල්වල අවශ්‍යතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෙත වගකීම, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |

| | | | |
|---|---|---|---|
| ඖෂධවේදී | 1028 | III සහ II ශ්‍රේණිය | (අ). රජයේ වෛද්‍ය ආයතනවල බාහිර / අභ්‍යන්තර ඖෂධාගාරයන්හි හා ශල්‍ය අංශයේ කාර්යභාර නිලධාරියාවේ. එම වෛද්‍ය ආයතනවල අවශ්‍ය ඖෂධ, ශල්‍ය උපකරණ, සැරහුම්, ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සහ වායු නිගමනය කරන කමිටුවල සාමාජිකත්වය දැරීම, පිරිවිතර සැකසීම හා පරීක්ෂා කිරීම, ජාතික හා ආයතනික මට්ටමෙන් වාර්ෂික ඇස්තමේන්තු පිලියෙල කිරීම, ප්‍රාදේශීයව මිළදී ගැනීම, බෙදාහැරීම, තොග පාලනය, ඖෂධ නිවැරදිව ගබඩාකරනය හා ගබඩා භාරකාරිත්වය දැරීම, අන්තරාදායික ඖෂධ භාරකාරත්වය, භාවිතය පිළිබඳ උපදෙස් සහිතව බාහිර හා නේවාසික රෝගීන්ට අවශ්‍ය ඖෂධ නිකුත් කිරීම, ගණන් තැබීම. තත්ත්ව පාලනය, ඖෂධ නිෂ්පාදනය, ඖෂධවල අන්තර්ක්‍රියා සම්බන්ධව කටයුතු කිරීම, ඖෂධ කළමනාකරණ කටයුතු ඉටු කිරීම, ඖෂධ සංයෝජක හා කම්කරු අධීක්ෂණය, ඖෂධ තාක්ෂණිකව ඇගයීම, ඖෂධ විශ්ලේෂණය, පිළිකා නාශක ධූලක ඖෂධ පිළියෙල කිරීම, යහපත් නිෂ්පාදන පිළිවෙත් පරීක්ෂාව, අවශ්‍ය අවස්ථාවලදී ප්‍රායෝගික පුහුණු කිරීම් කටයුතු සඳහා සහායදීම.<br>ඉහත කරුණු වලට අමතරව මෙම ශ්‍රේණිවල නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 01 - 01/2008, 01 - 03/2008, 01 - 04/2008, 01 - 05/2008 මඟින් පැවරෙන කාර්යයන් වලටද යටත් වේ.<br>-------------------------------- |
| | | ----- I ශ්‍රේණිය | (ආ). ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව ඉහත නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, පුහුණු සිසුන් අධීක්ෂණය, විභාග සඳහා දායකත්වය ලබාදීම හා අවශ්‍ය විටදී අංශ පරිපාලනය පිළිබඳව වගකීම දැරීම<br>ඉහත කරුණු වලට අමතරව මෙම ශ්‍රේණියේ නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 01 - 02/2008 මඟින් පැවරෙන කාර්යයන් හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ආචාර්ය ඖෂධවේදී | 05 | I ශ්‍රේණිය | ඖෂධවේදී ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, පුහුණු පාසල් තුළ විනය පවත්වාගෙන යාම,<br>පුහුණු පාසල්වල අවශ්‍යතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෙත වගකීම,තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු |
| විකිරණ ශිල්පී | 589 | III සහ II ශ්‍රේණිය | (අ). පරීක්ෂණ ඉල්ලුම් කරන වෛද්‍යවරයාගේ අරමුණ සඵල වන සේ විකිරණ විද්‍යුත් චුම්භක තරංග ආශ්‍රිතව ප්‍රතිබිම්බ ලබා ගැනීම හා ප්‍රතිකාර සිදු කිරීම,සැලසුම්ගත පරීක්ෂණ, සාමාන්‍ය පරීක්ෂණ සිදු කිරීම හා හදිසි පරීක්ෂණ ඒ අවස්ථාවේදීම සිදු කිරීම,වෛද්‍ය පරීක්ෂණවලදී රෝගියාගේ හෝ මෘත ශරීරයේ අනන්‍යතාවය තහවුරු කිරීමේ වගකීම,විකිරණ ආරක්ෂක මාත්‍රා මැනීම, නඩත්තුව හා එය ඉටු කිරීම, විකිරණ පරීක්ෂණයන් තත්ත්ව පාලනය කිරීම (quantity control) රෝගීන් නිශ්චලව තබා ගැනීමට අවශ්‍ය අනුරූප තැනීම හා භාවිතය, රෝගියාගේ ආරක්ෂාව පිළිබඳ වගකීම දැරීම, ශිෂ්‍ය ප්‍රායෝගික පුහුණුවට සහය වීම හා සේවාස්ථ පුහුණුව සඳහා සහයවීම,<br><br>රෝග නිර්ණක හා ප්‍රතිකාරක සඳහා වූ විකිරණ පරීක්ෂණ (සාමාන්‍ය / විශේෂ) හා විකිරණ ප්‍රතිකාරක කටයුතු කිරීම (CT හා MRI, න්‍යෂ්ඨික ප්‍රතිබිම්බ පරීක්ෂණ හා ලිතෝට්‍රිප්සි පරීක්ෂණ සමඟ) සමීප ප්‍රතිකාර (Brachy Therapy) දුරස්ථ ප්‍රතිකාර (Tele Therapy) කාලීන සැලසුම් කර සිදු කිරීම, අවශ්‍ය අවස්ථාවන්හි යටත් සේවාවන් අධීක්ෂණය |

| | | | |
|---|---|---|---|
| | | - - - - -<br>I<br>ශ්‍රේණිය | - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -<br>(ආ). ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව ඉහත නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, පුහුණු සිසුන් අධීක්ෂණය, විභාග සඳහා දායකත්වය ලබාදීම, අවශ්‍ය විටදී අංශ පරිපාලනය පිළිබඳව වගකීම දැරීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ආචාර්ය විකිරණ ශිල්පී පාසැල | 03 | I<br>ශ්‍රේණිය | විකිරණ ශිල්පී ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම,අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, පුහුණු පාසල් තුළ විනය පවත්වාගෙන යාම, පුහුණු පාසල්වල අවශ්‍යතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෙත වගකීම, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු |
| භෞත චිකිත්සක | 400 | III සහ II<br>ශ්‍රේණිය<br>- - - - -<br>I<br>ශ්‍රේණිය | (අ). රෝගීන් ඇගයීමකට ලක් කර ප්‍රතිකාර නිර්ණය කිරීම හා භෞත චිකිත්සක ප්‍රතිකාර ලබාදීම, පසුවිපරම හා රෝගීන් පිළිබඳ දත්ත පවත්වාගෙන යාම (රෝගීන් හා ප්‍රජාව තුළ) අවශ්‍ය අවස්ථාවලදී භෞත චිකිත්සක අංශයක් හෝ ඒකකයක් සංවිධානය කිරීම හා අදාල උපකරණ ඇනවුම් කිරීම, අළුත්වැඩියාව හා නඩත්තුව<br>- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -<br>(ආ). ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව ඉහත නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, පුහුණු සිසුන් අධීක්ෂණය, විභාග සඳහා දායකත්වය ලබාදීම හා අවශ්‍ය විටදී අංශ පරිපාලනය පිළිබඳව වගකීම දැරීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ආචාර්ය භෞත චිකිත්සක | 04 | I<br>ශ්‍රේණිය | භෞත චිකිත්සක ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම,<br><br>අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය,පුහුණු පාසල් තුළ විනය පවත්වාගෙන යාම, පුහුණු පාසල්වල අවශ්‍යතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෙත වගකීම, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු |
| වෘත්තීය චිකිත්සක | 124 | III සහ II<br>ශ්‍රේණිය<br>- - - - -<br>I<br>ශ්‍රේණිය | (අ). වෘත්තීය චිකිත්සාව පිළිබඳ සිද්ධාන්ත සහ මූලධර්ම උපයෝගී කර ගනිමින් ශාරීරිකව හෝ මානසිකව, තාවකාලිකව හෝ සදාකාලිකව, රෝගී / ආබාධිත වූ පුද්ගලයන් ඇගයීම, ප්‍රතිකාර කිරීම, පුනරුත්ථාපනය කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා සමාජගත කිරීම<br>- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -<br>(ආ).ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව ඉහත නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, පුහුණු සිසුන් අධීක්ෂණය, විභාග සඳහා දායකත්වය ලබාදීම, අවශ්‍ය විටදී අංශ පරිපාලනය පිළිබඳව වගකීම දැරීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ආචාර්ය වෘත්තීය චිකිත්සක | 02 | I<br>ශ්‍රේණිය | වෘත්තීය චිකිත්සක ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, පුහුණු පාසල් තුළ විනය පවත්වාගෙන යාම,පුහුණු |

| | | | |
|---|---|---|---|
| | | | පාසල්වල අවශ්‍යතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෙත වගකීම, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු |

සකස් කළේ :

අත්සන : ....................................

නම : එන්. කේ. එන්. හර්ෂනී

තනතුර: අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : 2017/11/15

පරීක්ෂා කළේ :

අත්සන : ....................................

නම : එච්. ශ්‍රියානි ප්‍රනාන්දු

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III ලේකම් වෙනුවට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" කොළඹ 10.

දිනය : 17/11/2017

අත්සන : ....................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : වෛද්‍ය ජේ. එම්. ඩබ්. ජයසුන්දර බණ්ඩාර සෞඛ්‍ය ... සෞඛ්‍ය ... අමාත්‍යාංශය

තනතුර : 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : 2017/11/18

නිල මුද්‍රාව :

ඇමුණුම 02

ඇමුණුම 02 - I

අමාත්‍යාංශය : සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය

**01.** විභාගයේ නම: වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ප්‍රමාණය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 08කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 05ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 08කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 05ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br><br>IV, XII, XIII, XIV, XIX, XLVII, XLVIII |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි පරිච්ඡේදමත සැකසේ.<br>I වන පරිච්ඡේද - වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම(මුදල් රෙගුලාසි 1 සිට 68 දක්වා)<br><br>III වන පරිච්ඡේද - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරී, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා) |

සකස් කළේ :

අත්සන : ..............................

නම : එන්. කේ. එන්. හර්ෂනී
අධ්‍යක්ෂ (පාලන) 02,
සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

තනතුර: "සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය : 2017/11/15

පරීක්ෂා කළේ :

අත්සන : ..............................

නම : එච්. ශ්‍රියානි ප්‍රනාන්දු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
ලේකම් වෙනුවට
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

තනතුර : "සුවසිරිපාය"
කොළඹ 10.

දිනය : 17/11/2017

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

වෛද්‍ය ජේ. ... ... ... ...ර බණ්ඩාර
සෞඛ්‍ය ...
සෞඛ්‍ය ... අමාත්‍යාංශය
385, පූජ්‍ය බද්දේගම ...වංශ හිමි මාවත,
කොළඹ 10.

2017.11.18

ඇමුණුම 02 - II

අමාත්‍යාංශය : සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය

**01.** විභාගයේ නම: වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

(අ). කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ප්‍රමාණය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 07කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 04ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 2 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 07කින් සමන්විත වන ඉන් ප්‍රශ්න 04ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 2 | 100 | 40% |

(ආ). දෙපාර්තමේන්තු පරීක්ෂණය:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ප්‍රමාණය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ ලිඛිත | ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 08කින් සමන්විත වන ඉන් ප්‍රශ්න 05ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |
| විෂයානුබද්ධ වාචික | විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේදී මුහුණපාන ගැටළු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. | විනාඩි 15 | 100 | 40% |
| විෂයානුබද්ධ ප්‍රායෝගික | විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණය | පරීක්ෂණය අනුව | 100 | 40% |

**03.** විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ලේකම්

**04.** විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍රය සැකසේ.<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br><br>XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>(I). VI වන පරිච්ඡේදය -<br>ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්<br>(මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා)<br><br>(2). XIII වන පරිච්ඡේදය -<br>සැපයුම් වැඩ හා සේවා:- සැපයීම්/ මිළට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම<br>(මුදල් රෙගුලාසි 708 සිට 775 දක්වා) |
| විෂයානුබද්ධ පරීක්ෂණය - ලිඛිත විභාගය | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ<br><br>I. රසායනාගාර තාක්ෂණවල මූලධර්ම හා ප්‍රගුණ කිරීම |

| | |
|---|---|
| | (අ). අනුජීව විද්‍යාව<br>(ආ). රසායන ව්‍යාධිවේදය<br>(ඇ). රක්තවේදය<br>(ඈ). සායන ව්‍යාධිවේදය<br>(ඉ). පටක ව්‍යාධිවේදය<br><br>II. රසායනාගාර කළමනාකරණය,<br>III. උපකරණ නඩත්තුව හා අළුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය<br>IV. රසායනාගාරයේ ආරක්ෂක පිලිවෙත<br>V. දෙපාර්තමේන්තු ක්‍රියාපරිපාටිය<br>(අ). උපකරණ, රසායන ද්‍රව්‍ය යනාදිය ඉල්ලුම් කිරීම<br>(ආ). ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමේ ක්‍රියාපිලිවෙල<br>(ඇ). රසායන ද්‍රව්‍ය ලබා ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ගණන් තැබීම<br><br>ඖෂධවේදී<br><br>I. භිෂග් කර්මය<br>II. අධිකරණ භිෂග් කර්මය (විෂ වර්ග, අබිං හා අන්තරාදායක ඖෂධ වර්ග ගණනය)<br>III. ඖෂධවේදය<br>IV. වාර්ෂික ඇස්තමේන්තු සහ ඖෂධ වර්ග සැරහුම් ශල්‍ය උපකරණ හා වෛද්‍ය වායු වර්ග යනාදිය ඉල්ලුම් කිරීම<br>V. ඖෂධ වර්ග හා ශල්‍ය උපකරණ ප්‍රාදේශීය වශයෙන් මිළදී ගැනීම හා එහි කාර්ය පරිපාටිය<br>VI. දින නියමිත නිෂ්පාදන අතිරික්තයන් කාලය ඉකුත් වූ සංසරණය නොවන ඖෂධ වර්ග සැරහුම් හා ශල්‍ය උපකරණ ඉවත් කර ගැනීමේ ක්‍රියා පිළිවෙල තත්ත්වයෙන් බාල නිසා ඉවත් කරන ලද ඖෂධ සහ හිස් ඇසුරුම් හා භාජන අපහරණය කිරීමේ ක්‍රියා පිළිවෙල,<br>VII. ඖෂධ වර්ග, සැරහුම් හා ශල්‍ය උපකරණ ආදිය ලබා ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ගණන් තැබීම සඳහා වන කාර්ය පරිපාටිය<br>VIII. ප්‍රයෝජනයට ගත නොහැකි වූ හා දූෂණය වූ ඖෂධ වර්ග හා ශල්‍ය උපකරණ යනාදිය ඉවත් කිරීමේ ක්‍රියා පිළිවෙල<br><br>විකිරණ ශිල්පී<br><br>I. විකිරණ ශිල්පය<br>II. විකිරණ ශිල්පයට භාවිතා කරනු ලබන නවීන උසස් උපකරණ<br>III. විකිරණ ඡායාරූප ශිල්පය<br>IV. විකිරණ ශිල්පීන්ගේ ආරක්ෂා වීම<br>V. පහත සඳහන් දෙපාර්තමේන්තු කාර්යාල පරිපාටි<br>(අ), නව එක්ස්රේ අංශයක් සංවිධානය කිරීම,<br>(ආ), ඉන්වෙන්ට්‍රි පොත් හා තොග පොත් නඩත්තු කිරීම,<br>(ඇ), උපකරණ හා රසායනික ද්‍රව්‍ය ඉල්ලුම් කිරීම<br>(ඈ), ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීම<br>(ඉ), උපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීමේ ක්‍රියා පිළිවෙත<br><br>භෞත චිකිත්සක<br><br>අ. 1. රූමැටියා රෝග<br>2. හෘද උරස් රෝග<br>3, ස්නායු රෝග<br>4, විකලාංග රෝග<br>5. ළමා රෝග<br>6. ප්‍රසව හා නාරි රෝග<br>7. පිලිස්සුම් අනතුරු<br>8. ක්‍රීඩා අනතුරු<br>ආ. භෞත චිකිත්සක අංශයක් හෝ ඒකකයක් සංවිධානය කිරීම<br>ඇ. බඩු ලැයිස්තුවක් නඩත්තු කිරීම<br>ඈ. බඩු ඇණවුම් කිරීම |

| | |
|---|---|
| | ඉ, උපකරණ නඩත්තුව හා අලුත්වැඩියා කිරීම<br>ඊ. ප්‍රජාපාදිත හා ආයතනික පුනරුත්ථාපන කටයුතු<br><br>වෘත්තීය චිකිත්සක<br>I. වෘත්තීය චිකිත්සාව මගින් ශාරීරික. මානසික, මන්දබුද්ධික හා ළමා මානසික රෝගීන් සඳහා ප්‍රතිකාර ක්‍රම<br>II. සංනිවේදනය සහ පරිපාලනය<br>III. මනෝ විද්‍යාව සහ මනෝ චිකිත්සාව<br>IV. වෘත්තීය චිකිත්සක අංශයක් අළුතින් සංවිධානය කිරීම, එහි ඇති උපකරණ නඩත්තුව සහ අළුත්වැඩියාව |
| විෂයානුබද්ධ පරීක්ෂණය ප්‍රායෝගික පරීක්ෂණය | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ. විකිරණ ශිල්පී. භෞත චිකිත්සක. වෘත්තීය චිකිත්සක<br>විෂය ක්ෂේත්‍රයට අදාලව හැකියාවන් හා ක්‍රියාකාරකම් හා බැදුනු ප්‍රායෝගික පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාල වන විෂය නිර්දේශය මෙයටද අදාල වේ.<br><br>ඖෂධවේදී - (මෙම පරීක්ෂණය සංවිධිත ව්‍යුහගත ප්‍රායෝගික පරීක්ෂණයකි. Organized Structured Practical Examination (O.S.P.E.)<br><br>රෝහල්වල සහ ඔසුසල්හි රෝගීන් සඳහා භාවිතා කරනු ලබන විලවුන්. උපකරණ හා ඖෂධීය නිෂ්පාදන පිළිබඳ වෘත්තීය දැනුම ලබාදෙන ලද සාම්පල / ආදර්ශයන් අනුසාරයෙන් ප්‍රායේගිකව ඇගයීමකට ලක් කරනු ලැබේ.<br>ඖෂධ නියම කිරීමේ තුන්ඩු හා ඇද ඉහපත් වාර්තා ආදර්ශයන් සපයා ඒවාට අදාල විෂය කරුණු පිළිබඳව ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. මෙම ප්‍රායෝගික පරීක්ෂණයේදී ආධාරක ලෙස නිළ සම්මත ග්‍රන්ථ අදාල වන පරිදි පරිශීලනය කිරීමට අවසර දෙනු ලැබේ.<br>(BP / BNF / Hospital Formulary etc.) |
| විෂයානුබද්ධ පරීක්ෂණය වාචික පරීක්ෂණය | විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාල විෂය නිර්දේශය වාචික සහ ප්‍රායෝගික පරීක්ෂණවලටද අදාල වේ. |

සකස් කලේ :

අත්සන : ..............................

නම : එන්. කේ. එන්. හර්ෂනී
අධ්‍යක්ෂ (පාලන) 02,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

තනතුර :

දිනය : 2017/11/[illegible]

පරීක්ෂා කලේ :

අත්සන : ..............................

නම : එච්. ශ්‍රියානි ප්‍රනාන්දු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
ලේකම් වෙනුවට
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

තනතුර :

දිනය : 17/11/[illegible]

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

වෛද්‍ය ජේ. එම්. ඩබ්. ජයසුන්දර බණ්ඩාර
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නම : ..............................

තනතුර : ..............................

දිනය : 2017/11/18

නිල මුද්‍රාව :

ඇමුණුම 02 - III

අමාත්‍යාංශය : සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය

**01.** විභාගයේ නම: වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ප්‍රමාණය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) | ප්‍රශ්න 8 න් 5 කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) | වෛද්‍ය රසායනාගාර තාර්මික විද්‍යාඥ<br><br>I. රසායනාගාර තාක්ෂණවල මූලධර්ම හා ප්‍රගුණ කිරීම<br>(අ). අනුජීව විද්‍යාව<br>(ආ). රසායන ව්‍යාධිවේදය<br>(ඇ). රක්තවේදය<br>(ඈ). සායන ව්‍යාධිවේදය<br>(ඉ). පටක ව්‍යාධිවේදය<br><br>II. රසායනාගාර කළමනාකරණය,<br>III. උපකරණ නඩත්තුව හා අළුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය<br>IV. රසායනාගාරයේ ආරක්ෂක පිළිවෙත<br>V. දෙපාර්තමේන්තු ක්‍රියාපරිපාටිය<br>(අ). උපකරණ, රසායන ද්‍රව්‍ය යනාදිය ඉල්ලුම් කිරීම<br>(ආ). ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමේ ක්‍රියාපිළිවෙල<br>(ඇ). රසායන ද්‍රව්‍ය ලබා ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ගණන් තැබීම<br><br>ඖෂධවේදී<br><br>I. විලයුන්, උපකරණ හා ඖෂධ පනතට අනුව ලියාපදිංචිය, ආනයනය, ගබඩාකරණය, විශ්ලේෂණය, පරීක්ෂණය, තොග හා සිල්ලර වෙළඳාම, වෙළඳ ප්‍රචාරණය සහ තොග බෙදාහැරීම පිළිබඳ දැනුමක් තිබිය යුතුය.<br>II. ඖෂධ කළමනාකරණය පිළිබඳ දැනුම<br>III. ඖෂධ ලේබනගත කිරීම පිළිබඳ අවබෝධය<br>IV. සබුද්ධික (Rational Use) ඖෂධ භාවිතය සම්බන්ධ දැනුම<br>V. ඖෂධ ඇස්තමේන්තු සැකසීම<br>VI. ප්‍රාදේශීය ඖෂධ මිළදී ගැනීම සම්බන්ධ දැනුම<br>VII. ඖෂධවල අතුරු අන්තර්ක්‍රියා සම්බන්ධව කටයුතු කිරීම (Adverse Drug Reactions Monitoring)<br>VIII. පරිපාලන කටයුතු (ඖෂධ සංයෝජක හා සුළු සේවක අධීක්ෂණය)<br>IX. රෝහල් ඖෂධ කමිටු : (Drug Therapeutic Committee and Drug Review Committee) සම්බන්ධයෙන් වන වගකීම් හා සහභාගීත්වය<br>X. ජීවිත ආරක්ෂක ඖෂධ හා අත්‍යවශ්‍ය ඖෂධ (Life Saving Drugs & Essential Drugs) පිළිබඳ දැනුම හා තොග පවත්වා ගැනීම |

| | |
|---|---|
| | XI. වෛද්‍ය සැපයීම් අංශයේ සම්බන්ධීකරණය කළමනාකරණය<br>XII. කල් ඉකුත් වූ හා නරක් වූ ඖෂධ (Expired and Quality Failure) සම්බන්ධව ගතහැකි ක්‍රියාමාර්ග<br><br>විකිරණ ශිල්පී<br><br>I. විකිරණ ශිල්පය<br>II. විකිරණ ශිල්පයට භාවිතා කරනු ලබන නවීන උසස් උපකරණ<br>III. විකිරණ ඡායාරූප ශිල්පය<br>IV. විකිරණ ශිල්පීන් හා කාර්ය මණ්ඩල ආරක්ෂාව සැලසීම<br>V. පහත සඳහන් දෙපාර්තමේන්තු කාර්යාල පරිපාටි<br>(අ), නව එක්ස්රේ අංශයක් සංවිධානය කිරීම<br>(ආ), ඉන්වෙන්ට්‍රි පොත් හා තොග පොත් නඩත්තු කිරීම<br>(ඇ), උපකරණ හා රසායනික ද්‍රව්‍ය ඉල්ලුම් කිරීම<br>(ඈ), ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීම<br>(ඉ), උපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීමේ ක්‍රියා පිළිවෙත<br><br>භෞත චිකිත්සක<br><br>අ. 1. රූමැටියා රෝග<br>2. හෘද උරස් රෝග<br>3, ස්නායු රෝග<br>4, විකලාංග රෝග<br>5. ළමා රෝග<br>6. ප්‍රසව හා නාරි රෝග<br>7. පිලිස්සුම් අනතුරු<br>8. ක්‍රීඩා අනතුරු<br>ආ. භෞත චිකිත්සක අංශයක් හෝ ඒකකයක් සංවිධානය කිරීම<br>ඇ. බඩු ලැයිස්තුවක් නඩත්තු කිරීම<br>ඈ. බඩු ඇණවුම් කිරීම<br>ඉ, උපකරණ නඩත්තුව හා අලුත්වැඩියා කිරීම<br>ඊ. ප්‍රජාපාදිත හා ආයතනික පුනරුත්ථාපන කටයුතු<br><br>වෘත්තීය චිකිත්සක<br><br>I. වෘත්තීය චිකිත්සාව මඟින් ශාරීරික, මානසික, මන්දබුද්ධික හා ළමා මානසික රෝගීන් සඳහා ප්‍රතිකාර ක්‍රම<br>II. සංනිවේදන සහ පරිපාලනය<br>III. මනෝ විද්‍යාව සහ මනෝ චිකිත්සාව<br>IV. වෘත්තීය චිකිත්සක අංශයක් අලුතින් සංවිධානය කිරීම, එහි ඇති උපකරණ නඩත්තුව සහ අලුත්වැඩියාව |

සකස් කළේ :

අත්සන : ..................................

එන්. කේ. එන්. හර්ෂනී
අධ්‍යක්ෂ (පාලන) 02,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නම :
තනතුර : ..................................
දිනය : ..................................

පරීක්ෂා කළේ :

අත්සන : ..................................

එච්. ශ්‍රියානි ප්‍රනාන්දු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
ලේකම් වෙනුවට
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

නම :
තනතුර : ..................................
දිනය : ....17/11/2017....

අත්සන : ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

2017/11/18

වෛද්‍ය ජේ. එම්. ඩබ්. ජයසුන්දර බණ්ඩාර
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.